# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 11,463 — 1958 ජූලි 31 වැනි බ්‍රහස්පතින්ද — 31.7.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඞ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ජෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**49 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය.** **අතිරේක ආහාර ද්‍රව්‍ය.**

**1950 අංක 29 දරණ මිළ පාලන පණත**

**නියෝගය**

හම්බන්තොට දිසාවේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලක තැන්පත් තම්බයියා සිවඥනම් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ අංක 3(2) දරණ වගන්තිය සමග කියවියයුතු අංක 4 දරණ වගන්තියෙන් මාවෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 ජූනි 17 වන දින අංක 11,362 දරණ ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පලකරන ලද 1958 ජූනි 10 වන දින අංක 45 දරණ ආහාර මිළ නියෝගයේ උපලේඛනයේ 1වන තීරයේ සඳහන් මයිසූර් පරිප්පු, උළුඳු (පියලිනොකළ), කඩල පරිප්පු සහ අර්තාපල් පිළිබඳව එම උපලේඛනයෙහි 2 සිට 7 දක්වා ඇති තීරයන්හි පිළිවෙලින් සඳහන් තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළද සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිළද මෙම නියෝගයෙන් අද සිට අවළංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 1වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක් ද සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද හම්බන්තොට දිස්ත්‍රික්කයේ සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දින් පටන්, මේ උපලේඛනයේ 2 සිට 7 දක්වා ඇති තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියමකරමි.

(3) මෙම උපලේඛනයේ 1වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍ය පිළිබඳව 1958 ජූනි 17 වෙනි දින අංක 11,362 දරණ ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද අතිරේක ආහාර ද්‍රව්‍ය සම්බන්ධව 1958 ජූනි 10 වෙනි දින නො. 45 දරණ ආහාර මිළ නියෝගයේ (iii) සිට (viii) දක්වා ජෙදයන්, මෙම නියෝගයෙහිම අන්තර්ගතවූ හැටියට සැළකිය යුතු ලෙසද මෙම නියෝගයෙන් නියම කරමි.

1958 ජූලි මස 25 වන දින පෙ.ව. 10ට හම්බන්තොටදී අත්සන් කරන ලදී.

තම්බයියා සිවඥනම්,
නියෝජ්‍ය (ආහාර) මිළ පාලකතැන,
හම්බන්තොට.

### උප ලේඛනය

| 1වැනි තීරය | තොග වෙළෙන්දෙකු විසින් දලබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | | | | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධබර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | |
|---|---|---|---|---|---|---|
| | 2වැනි තීරය | 3වැනි තීරය | 4වැනි තීරය | 5වැනි තීරය | 6වැනි තීරය | 7වැනි තීරය |
| | බෙලිඅත්ත, තංගල්ල, දෙද්දූවාවල, මහ වෙල | හම්බන්තොට, අම්බලන්තොට, වලස්මුල්ල, රන්න, වීරකැටිය | තිස්ස | කටුවන, කිරම, මිද්දෙනිය | බටහිර ගිරුවා-පත්තුවේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය | මාගම්පත්තු සහ නැගෙණහිර ගිරුවා පත්තු ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශ |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| උළුඳු (පියලි නොකළ) ... ... | 49 62 | 49 97 | 50 27 | 50 12 | 0 55 | 0 56 |
| කඩල පරිප්පු ... ... ... | 42 60 | 42 95 | 43 25 | 43 10 | 0 48 | 0 49 |
| මසූර් පරිප්පු ... ... ... | 56 52 | 56 87 | 57 17 | 57 02 | 0 57 | 0 58 |
| අර්තාපල් ... ... ... | 31 98 | 32 33 | 32 63 | 32 48 | 0 32 | 0 33 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුයි.


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

2073—ජේ. ඇන්. ආර් 25279—3,902 (7/58)